# විශ්වාසනීය වෙනසක්

# සරත් ෆොන්සේකා





# විශ්වාසනීය වෙනසක්

## මගේ පණිවුඩය

### විශ්වාසනීය වෙනසක් සඳහා කාලයයි මේ

වත්මන් රාජපක්ෂ පාලනය යටතේ අග හිඟකම් ද දුක් ගැහැට ද පිරුණු ජීවිතයක් ගෙවීමට ඔබ සැමට සිදුව තිබේ. අල්ලස, දූෂණය, පවුල්වාදය හා තමන්ගේ ප්‍රතිරූපය පුම්බා ගැනීම සඳහා සිදු කරන නාස්තිකාර වියදම් රටේ දියුණුව වළකා ජනතාව පීඩාවට පත්කොට තිබේ. යුද්ධය අවසාන විය. සංවර්ධනය සඳහා අවශ්‍ය කරන මානව හා ස්වාභාවික සම්පත් අප සතුව ඇත. එහෙත් රට සංවර්ධනය කිරීම හා ජනතා ගැටළු විසඳීම පසෙකලා රාජපක්ෂ පාලනය මහජන මුදල් නාස්ති කරමින්, ප්‍රජාතන්ත්‍රවාදය අහෝසි කරමින්, ඒකාධිපති පවුල් පාලනයක් ගොඩනගමින් සිටී. එය ඉතා බරපතළය. ශ්‍රී ලංකාව දැන් සංධිස්ථානයක සිටී. අප ගමන් කළ යුතු දිශාව කුමක්ද?

එය ජනවාරි 26 දා ඔබේ තේරීම මත තීන්දු වේ.

ඔබට මහින්ද රාජපක්ෂ පාලනයෙන් ලබාගත හැක්කේ මොනවාද? ඒ දැනට පවත්නා දුෂ්කර තත්ත්වය තවදුරටත් වැඩිකරගැනීමය. ඉහළ යන ජීවන වියදම මගින් ඔබේ පවුල මත තවත් බර පැටවෙනු ඇත. අල්ලස, දූෂණය, පවුල්වාදය හා තම ප්‍රතිරූපය පුම්බා ගැනීම සඳහා කරන නාස්තිකාර අධික වියදම්වල බර හා බදු බර, ඉහළ යන ජීවන වියදම මගින් ඔබේ පවුල මත පැටවී තිබේ. මේ තත්ත්වය ඔබට තව දුරටත් ඉදිරියට ගෙන යා හැක.

එසේ නොමැතිනම් විශ්වාසනීය වෙනසක් ඇති කිරීම සඳහා මට සහයෝගය දැක්විය හැකිය. මම දේශපාලනඥයෙකු නොව වෘත්තීයෙන් රජයේ සේවකයෙකි. මම පක්ෂයකට අයත් නැති කාටත් පිළිගත හැකි ශ්‍රී ලාංකික පුරවැසියෙකු වෙමි. මම ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කරමි. දූෂණය තුරන්කර, රැකියා නිර්මාණය කර, ආදායම් වැඩිකර, ජීවන වියදම පහත හෙළීම මගින් ඔබේ පවුලට උපකාර කරමි.

දැන් මේ වෙනස සිදු නොකළහොත් ආපසු කිසිදාක අවස්ථාවක් නොඑයි. අප රටට සමෘද්ධිමත් දේශයක් ලෙස නැගී සිටිය හැක. ඒ සඳහා වන හැකියාව අප සතුව තිබේ. ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කළ යුතුව තිබේ. යහපාලනය ගොඩනගමින් යුක්තිගරුක සහ විනය ගරුක සමාජයකට පදනම දැමිය යුතුව තිබේ.

**විශ්වාසනීය වෙනසක් සඳහා එකතු වන්න. සරත් ෆොන්සේකා වන මට ඔබේ වටිනා ඡන්දය දෙන්න.**

**සරත් ෆොන්සේකා**



# විශ්වාසනීය වෙනසක්

## යථාර්ථය

දීප්තිමත් රටක් වූ ශ්‍රී ලංකා භූමිය ලෝකයේ ජීවත්වීමට ඉතාමත් ම සුදුසු හා පහසු දේශයක් ලෙස හඳුන්වා දිය හැකි ය. ත්‍රස්තවාදී යුද්ධය අවසන් වීමෙන් පසු ජනතාව අපේක්ෂා කළ සාමකාමී වාතාවරණය ගොඩනැගීමට රාජපක්ෂ පාලනය අසමත්වී ඇති අතර ත්‍රස්තවාදය අවසන් කළ මොහොතේ අනාගතය පිළිබඳ ගොඩනැගුණු අපේක්ෂාවන් මුළුමනින්ම බිඳවැටී ඇත. ආර්ථිකමය වශයෙන් රට විශාල ප්‍රපාතයකට ඇදවැටී ඇත. නීතිය සහ විධානයේ, ආධිපත්‍යය මුළුමනින්ම බිඳවැටී ඇත.

බොහෝ පවුල්වලට යහපත් ජීවන තත්ත්වයක් පවත්වාගෙන යාම ඉතා අසීරු වී තිබේ. සමහර පවුල්වලට දවසේ තුන් වේල පවා සපයා ගැනීමේ දුෂ්කරතාවක් පවතී. ඉහළ වැටුප් සහිත රැකියා සොයා ගැනීම අපහසු ය. එසේ ම පවතින රැකියා අවස්ථා ද ගිලිහෙමින් පවතී. ආණ්ඩුවේ තිබෙන සොච්චම් රැකියා ප්‍රමාණයත් පිංපඩි මෙන් මැතිවරණ සමයේ දී සිය ගෝලබාලයන් අතරේ බෙදා හැරෙයි. අනෙක් අවස්ථාවල ද රැකියා විරහිතවූවන්ට පහර දෙමින්, කඳුළු ගෑස් ගසමින් එළවා දමයි.

ගොවීන්ට, සිය වියදම් කළ මුදලවත් බෝග විකුණා උපයා ගත නොහැකි ය. ධීවරයින්ගේ තත්ත්වයද එසේ ම ය. රජයේ සේවකයින් තම දිනපතා පැවැත්ම සිදුකර ගන්නේ ඉතාමත් අසීරුවෙනි. එසේ ම විශ්‍රාමිකයින් ද අගහිඟකම්වලින් පීඩා විඳින අතර ලක්ෂ ගණනක් වූ පෞද්ගලික අංශයේ සේවක පිරිසට ද යාන්තමින් දවස ගෙවා ගැනීමට සිදුව තිබේ. කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යාපාරිකයන්ගේ ව්‍යාපාර කටයුතු ද බොහෝ සෙයින් අඩාල වී ඇත. වසරක් පාසා දහස් ගණනක් පිරිස් අඩු ආදායම් හා හිතකර නොවන පරිසර තත්ත්වයන්ගෙන් සමන්විත පිටරට රැකියා සඳහා තල්ලු වන ත්ත්වයක් උදාවී ඇත. සමෘද්ධි ගෙවීම් ද දේශපාලන හෙන්චයියන් සඳහා ම වන අතර දුප්පත් ජනතාවට ඉන් පිළිසරණක් නොමැත.

රට ත්‍රස්තවාදයෙන් මුදා ගත් රණ විරුවන්ට තමන්ගේ ම කියා නිවසක්වත් නොමැති අතර යුද්ධයෙන් ආබාධිත පිරිස් දයා විරහිතව නොසළකා හැර ඇත. ඔවුන් එසේ දුෂ්කර ජීවිතයකට පත්කර තිබියදී, රාජපක්ෂ, යුද්ධයේ ජයග්‍රහණයෙන් රජ කිරුළක් පළඳවාගෙන සිටී.



# විශ්වාසනීය වෙනසක්

පුද්ගලයන් අතළොස්සක් විශාල ලෙස ධනය රැස්කර ගනිමින් සිටින අතර සෙස්සන්ගේ ජන ජීවිතය අතිශයින් ම දුක්ඛදායක වී තිබේ. රාජපක්ෂ පාලනයේ ස්වාභාවය මෙය යි. මෙසේ වීමට හේතුව කුමක් ද? අදහාගත නොහැකි මට්ටමින් පවතින දූෂණය, අල්ලස, ඥාති සංග්‍රහය හා තමන් පුම්බා ගැනීම වෙනුවෙන් කරන නාස්තිකාර වියදම්, රටේත්, ජනතාවගේත් දියුණුවට හා සෞභාග්‍යට බාධා පමුණුවමින් පවතී.

දූෂණයේ තරම කොතරම් ද කිවහොත් එය රජයේ මුල්‍ය සහ ආර්ථික ක්ෂේත්‍රයේ ඉහළම උපදේශක තනතුරක් දරණ ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමයේ සභාපති මහාචාර්ය ඒ. ඩී. වී. ද. එස්. ඉන්ද්‍රරත්න මහතාට අනුව 2006 වසරේ දළ ජාතික නිෂ්පාදනයෙන් 9% කි. වෙනත් ආකාරයෙන් කිවහොත් මෙම දූෂණය නතර කර ගැනීමට සමත් වේ නම් වෙනත් කිසිදු ආයෝජනයක් හෝ ඵලදායිතාව වැඩි කිරීමකින් තොරව ශ්‍රී ලංකාවේ වාර්ෂික ආර්ථික වර්ධන වේගය අවම වශයෙන් තවත් 2% කින් වැඩිකිරීමට හැකි වනු ඇත. (Impact of Corruption on Poverty and Economic Growth, 2007, pp 11-12) මෙම ගණනය 2009 අපේක්ෂිත දළ දේශීය නිෂ්පාදිතයට ආදේශ කළ විට සිදුවූ නාස්තිය රුපියල් කෝටි 35,000 ත් 40,000 ත් අතර ප්‍රමාණයකි. මෙය පසුගිය වසරේ ආරක්ෂක අමත්‍යංශයේ අනුමත ඇස්තමේන්තු මුදල මෙන් දෙගුණයකි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ඇස්තමේන්තු මුදල මෙන් පහළොස් ගුණයකි.

මෙම තත්ත්වය ඔබට සහ ඔබේ පවුලට කෙසේ නම් බලපානු ඇත් ද? දූෂිත බව නොවන්නට ආණ්ඩුවට සිය ආදායම් ලෙස විශාල මුදලක් එකතු කොට ගත හැකිව තිබිණ. එමගින් අතිරේක රැකියා උත්පාදනයට හා ජීවන වියදම් පාලනය කර පවත්වා ගැනීමට හැකිව තිබිණ. සමාජ සුබසාධනය වෙනුවෙන් විශාල මුදල් සම්භාරයක් යෙදවීම මගින් දුප්පතුන්ගේ සුබසාධනය සැළසිය හැකිව තිබිණ. අපට රෝහල් පහසුකම් මීට වඩා ව්‍යාප්ත කිරීමටත්, උසස් තත්ත්වයේ ඖෂධ ලබා දීමටත් හැකියාවක් තිබිණ. වඩා පහසුකම් සහිත පාසැල් පද්ධතියක් හඳුන්වාදීමෙන් ජන ජීවිතය නගා සිටුවිය හැකිව තිබිණ. මේ සියල්ලට වඩා දූෂිත බවින් තොර වුනි නම් අත්‍යවශ්‍ය ආහාර වෙනුවෙන් පනවා ඇති අධික බදු අඩුකර ජනතාවට ආහාර සඳහා වියදම් වන මුදල අවම කිරීමට හැකියාව තිබිණ. දූෂිත ක්‍රියාමාර්ග නොවන්නට අපට පහසුවෙන් ආයෝජන සඳහා අවස්ථා විවෘත කළ හැකිව තිබු අතර එමගින් උසස් ගෙවීම් සහිත රැකියා මාර්ග උත්පාදනය කළ හැකිව තිබිණ. ජන ජීවිතය මෙතරම් දු ක්ඛදායක නොවිය යුතුව තිබිණ.



# විශ්වාසනීය වෙනසක්

ප්‍රශ්නය දැන් පැහැදිලි ය. ජනාධිපති රාජපක්ෂ නායකත්වය ලබා දෙන්නේ මිල මුදලට කෑදර දූෂණයෙන් පිරි පරිපාලනයකට ය. මහින්ද රාජපක්ෂ නායකත්වය දෙන ආණ්ඩුව ඔහුගේ පවුලේ සාමාජිකයින්ට හා සමීප සගයන්ට ප්‍රධාන තනතුරු හා බලය සපයයි. ශ්‍රී ලාංකිකයින් ජීවත්වීම සඳහා අරගලයක යෙදී සිටින අතර රාජපක්ෂ පරපුර ධන කුවේරයින් බවට පත්වෙමින් තිබෙන බව පෙනේ. දූෂණයට විරුද්ධව කටයුතු නොකරන්නේත්, දූෂණය පිටු දැකීමේ ක්‍රියාදාමයක් නොමැත්තේත් හත්මුතු පරම්පරාවටම අවශ්‍ය ධනය උපයා ගැනීමට ඉන් බාධා පැමිණිය හැකි නිසා බව පෙනේ. 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය බලාත්මක නොකිරීමත්, ස්වාධීන කොමිෂන් සභා ස්ථාපිත නොකිරීමත්, අල්ලස් හෝ දූෂණ කොමිසම ක්‍රියාත්මක නොකිරීමත් මේ සඳහාම සිදු වූවක් බව පෙනී යයි.

යුද්ධය අවසන් වී තිබියදී අප සතු සම්පත් ශ්‍රී ලංකාවේ සංවර්ධනය වෙනුවෙන් යොදා ගත යුතු අවස්ථාවක සිටියත් අප පැමිණ ඇත්තේ මංසන්ධියක් වෙත ය. එහෙත් රාජපක්ෂ පවුල් පාලනයට ජනතාවට උදව් කරන මාර්ගය තෝරා ගැනීමට කිසිදු ඕනෑකමක් නැති බව පෙනේ.

අපට අවශ්‍ය වන්නේ නියමිත නීතිමය රාමුවක් හා නියාමනයක් තුළ දූෂණයෙන් තොර ජනතාවට හිතකර පුද්ගලික අංශය සහ රාජ්‍ය අංශය ඒකාබද්ධ වූ සමතුලිත ආර්ථික ක්‍රම වේදයකි. මේ සඳහා අප නිෂ්පාදකයන් සහ ව්‍යාපාරික ප්‍රජාවට දිරිදිය යුතුය. මීට අමතරව අප සේවක සහ සේව්‍යයාගේ වගකීම් සහ අයිතිවාසිකම් සුරැකිය යුතු වන අතර වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වය ද රැක ගත යුතු ය. ඉකුත් වසරේ ඇති වූ දැඩි පසුබෑම්වලින් පසු අප උගත යුත්තේ ආර්ථිකය මනා ලෙස කළමනාකරණය කළ යුත්තේ කෙසේ ද යන්න යි. එසේම අපගේ ආර්ථික ප්‍රතිපත්ති පෙර ආණ්ඩුවල තිබු වැරදිවලින් මුදවා ගත යුතුය. මේ නිසා අප අනුගමනය කළ යුත්තේ වඩා නිරවුල් ක්‍රමවේදයකි.



# විශ්වාසනීය වෙනසක්

අපට අවශ්‍ය වන්නේ ගැටළුවලින් නිදහස් ශ්‍රී ලංකාවක් තුළ ශක්තිමත් ආර්ථික වර්ධනයක් ලබා ගැනීමයි. අප නිර්මාණය කළ යුත්තේ සෑම ශ්‍රී ලාංකිකයෙකුටම ධනය උත්පාදනය කළ හැකි සමෘද්ධිමත් ශ්‍රී ලංකාවකි. අප උනන්දු කළ යුත්තේ ගම ආශ්‍රිත කෘෂි, වෙළඳ ව්‍යාපාර හා සේවාවන් මගින් ලක්ෂ 200 කට අවශ්‍ය දෑ පමණක් නොව ජාත්‍යන්තර වෙළඳපොළට අවශ්‍ය නිෂ්පාදනයන් ය.

අප ක්‍රමයෙන් ඉදිරියට යත්ම අපගේ පාරම්පරික ව්‍යාපාරික දැනුම හා පළපුරුද්ද උපයෝගී කර ගැනීමට උනන්දු විය යුතුය. අපේ ප්‍රධාන අවධානය යෙදවිය යුත්තේ උපදවන ධනය ටික දෙනෙක් අතර බෙදා හැරීමට නොව සියළු ජනතාව අතර බෙදාහැරීමටය. මෙය ඉටු කිරීම සදහා අප වෙනස් විය යුතුය. ශ්‍රී ලංකාවට අවශ්‍ය වන්නේ විශ්වාස කළ හැකි වෙනසකි.



# විශ්වාසනීය වෙනසක්

## මගේ දැක්ම

මට ස්ථිරවම විශ්වාස කළ හැකි වෙනසක් අපේ රටට ගෙන ආ හැක.

යුද හමුදාවේ වසර 40 ක පළපුරුද්දක් ඇති මම වෘත්තීමය දේශපාලනඥයෙකු නොවෙමි. මම නිර්භීතව සෘජු තීරණ ගත හැකි නායකයෙකු වෙමි. මම ගනු ලැබූ තීරණ මෙන්ම ඉදිරියේදී ගනු ලබන තීරණත් සෑම විටම මව් බිමටත් ජනතාවටත් පක්ෂපාතී විය. යුද හමුදාපති ධුරය දරන කාළයේදී මා උසස්වීම් ලබා දුන්නේ ජ්‍යෙෂ්ඨත්වය මෙන්ම දක්ෂතාවයද සැළකිල්ලට ගනිමිනි. මම ඉදිරියේත් නිවැරදි පුද්ගලයා නිවැරදි තනතුරට පත් කරමි. මට නිදහස් හා ප්‍රජතන්ත්‍රවාදී  ශ්‍රී ලංකාවක් පිළිබඳව පැහැදිලි දැක්මක් ඇත.

එහි මූලික අරමු වන්නේ දූෂණයෙන් තොරවූ ශ්‍රී ලංකාවක්. වෙනස්කම් නැතිව සැමටම එකසේ සළකන ශ්‍රී ලංකාවක්. ජන විවිධත්වය සහ සංස්කෘතික විවිධත්වය පාදක කොටගත් ශක්තිමත් අනන්‍යතාවක් ඇති ශ්‍රී ලංකාවක්.

ප්‍රජාතන්ත්‍රවාදී පිළිගැනීම් තහවුරු කළ හා විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කළ ශ්‍රී ලංකාවක්. එසේම උසස්ම මිනිසුන්ගෙන් සමන්විත, ජනතාවට වගකියන, ජනතාවගේ අවශ්‍යතාවන් ප්‍රමුඛ කොටගත් පාර්ලිමේන්තුවක් ඇති ශ්‍රී ලංකාවක්. එසේම නිදහස් ජන මාධ්‍යයක් හා තොරතුරු දැන ගැනීමේ අයිතිය තහවුරු කරන ශ්‍රී ලංකාවක්.

සුදු වෑන් සංස්කෘතිය, පැහැර ගැනීම් සහ මිනිස් ඝාතන ඉතිහාස පොතට පමණක් සීමා කළ ශ්‍රී ලංකාවක්.

සෑම පවුලකටම තුන්වේල සරිකරගත හැකි ශ්‍රී ලංකාවක්.



# විශ්වාසනීය වෙනසක්

පවුල්වලට ආරක්ෂිත සෞඛ්‍ය සේවයක් හා ඔවුන්ගේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබාදෙන උසස් පාසල් හා විශ්ව විද්‍යාල පද්ධතියක රැකවරණය ලැබෙන ශ්‍රී ලංකාවක්.

පුහුණු තරුණ ශ්‍රමය හා කාන්තා අයිතිවාසිකම් තහවුරු කරන ශ්‍රී ලංකාවක්.
සෑම ගොවි පවුලකටම අභිමානයෙන් ජීවත් විය හැකි ශ්‍රී ලංකාවක්.

සහල් මෝල් හිමියන්ගේ මාෆියාවෙන් ගොවියා නිදහස් වූ ඔවුන්ට තම අස්වැන්න සඳහා සාධාරණ සහතික මිලක් ලැබෙන ශ්‍රී ලංකාවක්. ධීවරයින් සමාජයේ අභිමානවත් කොටස්කරුවන් වන ශ්‍රී ලංකාවක්.

රජයේ සේවකයින් හා පෞද්ගලික අංශයේ සේවකයින් උසස් ආදායමකට හා උසස් ජීවන තත්ත්වයකට හිමිකම් කියන ශ්‍රී ලංකාවක්. අපගේ වැඩිහිටි පරම්පරාවට සමාජ රැකවරණය හා සමාජ ගරුත්වය ලැබෙන ශ්‍රී ලංකාවක්.

කුඩා හා මධ්‍යම පරිමාණයේ ව්‍යාපාරවල නිෂ්පාදන විදේශ වෙළඳපොලට රැගෙන යන ශ්‍රී ලංකාවක්. කප්පම්, කොමිස් සහ අනෙකුත් බාධකවලින් තොරව, ව්‍යාපාරිකයින්ට යෝග්‍ය පරිසරයකින් යුතු ව්‍යවසායකයන්ට පහසුවෙන් ව්‍යාපාර කරගෙන යා හැකි ශ්‍රී ලංකාවක්.

ශ්‍රී ලාංකිකයින්ට ලොව ඕනෑම තැනකට උසස් සේවාවන් සැපයිය හැකි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පුළුල් ලෙස ලබාගත හැකි ගෝලීය දියුණු ආර්ථිකයට සම්බන්ධවූ ශ්‍රී ලංකාවක්.



# විශ්වාසනීය වෙනසක්

රට වෙනුවෙන් සටන් කළ රණවිරුවන් රැක බලා ගන්නා ශ්‍රී ලංකාවක්.

**ජනතා** ගෞරවයට ලක්වෙන, අපක්ෂපාතීව කටයුතු කරන, ජනතාවගේ විශ්වාසය දිනූ, විනයගරුක, ගෞරවනීය පොලිස් සේවාවක් ඇති ශ්‍රී ලංකාවක්.

**ආබාධිත** වුවන්ට හා සාමාන්‍ය පුද්ගලයින්ට සමාන අවස්ථා ඇති ශ්‍රී ලංකාවක්.

**රැකියා** නොමැති තරුණ තරුණියන්ට රැකියා අවස්ථා බිහි කරන ශ්‍රී ලංකාවක්.

**මේ** සියල්ලන්ගෙන් සපිරි ශිෂ්ඨ සම්පන්න රටක් බිහි කිරීම සඳහා වූ සැලැස්මක්ද, කාලසටහනක්ද, අධිෂ්ඨානයක්ද මා සතුව ඇත.



# විශ්වාසනීය වෙනසක්

## මා විසින් ඔබ වෙත දෙනු ලබන ප්‍රතිඥා

1 මම ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කරන අතර සාමය දිනා ගනිමි.

2 මම දූෂණය හා නාස්තිය මුලිනුපුටා දමමි.

3 මම අතමිට සරු කර ගැනීමට හැම පවුලකටම උපකාර කරමි.

4 මම ජීවන බර සැහැල්ලු කරමි.

5 මම ජාතික ඒකාග්‍රතාවය ගොඩනගමි.

6 මම සෞඛ්‍ය සේවය හා අධ්‍යාපනය ක්‍රමවත්ව නගා සිටුවමි.

7 මම කාන්තා අයිතීන් සුරකින ගෞරවනීය තත්වයක් ඇතිකරමි.

8 මම තරුණ පරපුරට රැකියා ලබාදෙමි.

9 මම යුක්තිගරුක සහ විනය ගරුක සමාජයකට අඩිතාලම දමමි.

10 මම ජාතික ආරක්ෂාව සුරකිමි.



# විශ්වාසනීය වෙනසක්

## 1. මම ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කරන අතර සාමය දිනා ගනිමි.



අප ඉදිරියේ ඇති ප්‍රධාන අභියෝගය වන්නේ ඒකාධිපති පාලනයට පාර කපන විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කොට ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කිරීමය. ජනාධිපති ලෙස පත්වීමෙන් අනතුරුව මා සිදුකරන ප්‍රථම කටයුත්ත වන්නේ, ස්වාධීන කොමිෂන් සභා යළි පිහිටුවීමට ඉඩ සැලසෙන පරිදි ව්‍යවස්ථාදායක සභාව පත්කොට 17 වන සංශෝධනය පණගැන්වීමයි. මම ඉන් ඉක්බිතිව දැනට පවතින යෝධ ඇමති මණ්ඩලය අහෝසි කරමි. අනතුරුව මාගේ භාරකාර කැබිනට් මණ්ඩලය සඳහා සාමාජිකයින් නම් කරන ලෙස දැනට පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලු පක්ෂවලට ආරාධනා කරමි. ඉන්පසු මම පාර්ලිමේන්තුව විසුරුවා හරිමි. හදිසි අවශ්‍යතාවයක් ලෙස සළකා පවතින හදිසි නීති රෙගුලාසි සංශෝධනය කරමි. මසක් ඇතුළත විධායක ජනාධිපති ක්‍රමය අහෝසිවන ව්‍යවස්ථා සංශෝධන පනත අනුමත කිරීම සඳහාද, පුවත්පත් මණ්ඩලය අහෝසි කිරීමේ පනත හා තොරතුරු දැන ගැනීමේ නිදහස පිළිබඳ පනත සඳහාද, කැබිනට් පත්‍රිකා ඉදිරිපත් කරමි. මාගේ භාරකාර කැබිනට් මණ්ඩලය යටතේ ශ්‍රී ලංකාවේ වඩාත්ම නිදහස් හා සාධාරණ මැතිවරණය පැවැත්වීම සහතික කිරීම පිණිස අවශ්‍ය කරන ක්‍රියා මාර්ග මම ගනිමි. මෙම නව පනත් නව පාර්ලිමේන්තුවට මසක් ඇතුළත ඉදිරිපත් කරමි.

විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමෙන් පසු ජනතාවට වගකියන ජනාධිපතිවරයා ලෙස පාර්ලිමේන්තුව සමඟ කටයුතු කරමින් මවිබිමටත් ජනතාවටත් මගෙන් ඉටුවිය යුතු සේවය නොපිරිහෙලා ඉටුකරමි.





# විශ්වාසනීය වෙනසක්

## 2. මම දූෂණය හා නාස්තිය මුලිනුපුටා දමමි.




සති තුනක් ඇතුළත මාගේ භාරකාර කැබිනට් මණ්ඩලය දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මුතියට අනුකූලව වංචාව සහ දූෂණය පිටු දැකීම සඳහා නව නීති සම්පාදනය කරනු ඇත.

අල්ලස හා දූෂණය සමඟ සටන් කිරීම සඳහා ප්‍රමාණවත් බලතල ඇති වඩා ශක්තිමත් නව ආයතනයක් පිහිටුවමි. දූෂණයට වරදකරුවන් වූ අයගේ අයථා ලෙස උපයාගත් දේපොළ රාජ සන්තක කරමි. සියළුම මහජන මුදල් විගණනය කිරීම සඳහා ස්වාධීන කොමිෂන් සභාවක් පත් කරමි. ලොව දියුණු ප්‍රජාතන්ත්‍රවාදී රටවල පවතින පරිදි පාර්ලිමේන්තු ආචාර ධර්ම පිළිබඳ නීති සම්මත කර ගන්නා මෙන් මම නව පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටිමි. මුදල් පිළිබඳ පාර්ලිමේන්තු ආචාර ධර්ම පවත්වා ගෙන යාම සඳහා පාර්ලිමේන්තු ආචාර ධර්ම පිළිබඳ ස්වාධීන කොමසාරිස්වරයෙකු පත්කරමි. රාජ්‍ය මූල්‍ය විගණනය පිළිබඳ ඇතිවී තිබෙන බාධා හා දුෂ්කරතා ඉවත් කිරීමට හා විගණන ක්‍රියාවලිය ශක්තිමත් කිරීමට අවශ්‍ය නීතිමය හා ප්‍රායෝගික පියවර ගනිමි. මහජන දේපල නාස්ති කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය කඩිනම් පියවර ගනිමි.

මගේ වත්කම් සහ බැරකම් වාර්ෂිකව මහජනතාවට ඉදිරිපත් කරමි.





# විශ්වාසනීය වෙනසක්

## 3. අතමිට සරු කර ගැනීමට හැම පවුලකටම උපකාර කරමි.



පොහොර සහනාධාරය යටතේ යූරියා මිටියක් රු. 350 කට ද අනෙක් පොහොර සඳහා සහනාධාරයද ඇතුලුව විවෘත වෙළඳ පොලෙන් ලබාදීම සහතික වෙමි.

හාල් මෝල් මාෆියාව බිඳ දමන බවටත් වෙළඳපොල මත පදනම් වූ සාධාරණ සහතික මිලක් නියම කරන බවටත් සහතික වෙමි. මම 2010 මහ කන්නයේදී සම්බා වී කිලෝව රු. 40 කටද නාඩු කිලෝව රු. 35 කට මිලදී ගන්නා බවට සහතික වෙමි. මේ නිසා ගොවියාට ඊටත් වඩා වැඩි මිලක් වෙළඳපොළෙන් ලබා ගැනීමට හැකි වනු ඇත. කාබනික කෘෂිකර්මය වර්ධනය කිරීමටද මාගේ අවධානය යොමුකරමි. කිරි ගොවීන්ට කිරි ලීටරක් සඳහා ගෙවන අවම මිල රු. 45 ක් දක්වා වැඩිකිරීමට සහතික වෙමි. අළුත් අවුරුද්ද සමයේ භාණ්ඩ හිඟයකින් තොරව දැරිය හැකි මිලකට ලබා ගැනීම සහතික කරමි. සියලුම උත්සව අත්තිකාරම් කලට වේලාවට ගෙවීමට කටයුතු කරමි.

වතු කම්කරුවන්ගේ වැටුප රු. 500 ක් දක්වා වැඩි කිරීමට කෙරෙන සාකච්ඡා ඉදිරියට ගෙන යන අතර ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීමට පියවර ගනිමි. මහ බැංකුවේ ආකාර්යක්ෂමතා නිසා විවිධ මුල්‍යමය වංචාවලට ගොදුරුවූ පවුල්වලට හැකි උපරිම අයුරින් වන්දි ලබාදීමට සහතික වෙමි.

ගොවි විශ්‍රාම වැටුප වැඩි කරන අතර ධීවරයින් සඳහා නව විශ්‍රාම වැටුප් ක්‍රමයක් හඳුන්වා දෙමි. අවිධිමත් රැකියාවන්හී නිරතවී සිටින අයට ඔවුන්ගේ විශ්‍රාම දිවියේ ආරක්ෂාව සැලසීමට පියවර ගනිමි.
මම රජයේ සේවකයන්ගේ වැටුප රු. 10,000 කින් වැඩි කරන අතර, සියලු විශ්‍රාම වැටුප් විෂමතා ඉවත් කරමි. මම අවම සමෘද්ධි දීමනාව රු. 500 ක් දක්වා වැඩි කරමි. මම දේශපාලන හේතු නිසා සමාජ රැකවරණය අහිමි කර ඇති සියලු පවුල්වලට එය ලබාදෙමි.

මම සමෘද්ධි නියාමකවරුන්ගේ දුක් ගැනවිලිවලට විසඳුම් ලබාදෙමි. මම පුද්ගලික අංශය සමග සාකච්ඡා කොට ඔවුන්ගේ ව්‍යාපාරවල වියදම අධික කොට ඇති අනවශ්‍ය බදු හා කප්පම් ඉවත් කිරීම තුළින් පුද්ගලික අංශයේ සේවකයින්ගේ වැටුප් වැඩි කිරීමට පියවර ගනිමි.



ඇගලුම් ක්ෂේත්‍රයේ තුන් ලක්ෂයක් දෙනාගේ රැකියා රැක ගැනීම පිණිස ජී එස් පී ප්ලස් බදු සහනය නැවත ලබා ගැනිම සහතික කරමි. හදිසි කටයුත්තක් සේ සලකා සුළු හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරිකයින්ගේ දැවෙන ප්‍රශ්න විසඳීම සඳහා බලය සහිත කමිටුවක් පත් කරමි.



# විශ්වාසනීය වෙනසක්

## 4. මම ජීවන බර සැහැල්ලු කරමි.




අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මත පනවා ඇති අධික බදු කපා හැර ආහාර මිල පහත හෙළීමට වහාම පියවර ගනිමි. මම ඩීසල් හා භූමිතෙල් මත පනවා ඇති සියලු බදු ඉවත් කරමි. ශ්‍රේෂ්ඨාධිකරණය දුන් තීන්දුව පරිදි පෙට්‍රල් මිලද අඩු කරමි.

එල්. පී. ගෑස් සහ අනෙකුත් අත්‍යවශ්‍ය භාණ්ඩවලට පනවා ඇති බදු ද සැළකිය යුතු ප්‍රමාණයකින් අඩු කරමි.

පාසැල් ළමුන් ප්‍රවාහනය කරන වෑන් රථ සහ ත්‍රීරෝද රථවලට දුම් සහතිකය සඳහා අයකරනු ලබන මුදල ඉවත් කිරීමෙන් සහ පුද්ගලික බස් රථ හා ත්‍රීරෝද රථ අමතර කොටස් සඳහා බදු සහන ලබාදීමෙන් ප්‍රවාහන වියදම අඩු කරමි.





# විශ්වාසනීය වෙනසක්

## 5. මම ජාතික ඒකාග්‍රතාවය ගොඩනගමි.



මම යුද්ධයෙන් පීඩාවිඳි සියළුම දෙමළ, මුස්ලිම්, සිංහල වැසියන්ට උපකාර කරමි.

යුද්ධය නිසා පීඩාවට පත් පුද්ගලයින්ට හා ප්‍රදේශවලට කඩිනම් සහන සලසන වැඩසටහනක් ක්‍රියාත්මක කරන අතර එමගින් දෙමළ කතා කරන ජනතාවගේ දැවෙන ප්‍රශ්නවලටද විසඳුම් ලබාදීමට හැකිවනු ඇත. කඳවුරුවල දැනට ඉතිරි වී ඇති අවතැන් වූවන් වහාම නැවත පදිංචි කරවමි.

නැවත පදිංචිවීම සඳහා පවුලකට දෙන අවම ආධාරය රුපියල් ලක්ෂයක් දක්වා වැඩි කරන අතර පවුලේ අවශ්‍යතා ඇගයීමෙන් පසු වැඩිමනත් ආධාර ලබාදීමට කටයුතු කරමි. මම පළමු මාසය තුළ මෙතෙක් යුද්ධය නිසා අවතැන් වූ සියලුම දෙමළ, මුස්ලිම්, සිංහල වැසියන් ලියාපදිංචි කිරීමට පියවර ගන්නා අතර, අප්‍රමාදව ඔවුන් නැවත පදිංචි කරවමි.

ත්‍රස්ත්‍රවාදී කටයුතු සම්බන්ධයෙන් අත් අඩංගුවේ තබාගෙන සිටින සියලු දෙනා පිළිබඳ පරීක්ෂණ කඩිනම් කර අධිකරණයට ඉදිරිපත් කිරීම, පුනරුත්ථාපනය කිරීම හෝ නිදහස් කිරීම සිදු කරමි. අපගේ වාර්ගික, ආගමික හා සංස්කෘතික විවිධත්වය මත පදනම් වූ ශ්‍රී ලාංකික අනන්‍යතාව මම ප්‍රවර්ධනය කොට පෝෂණය කරමි. පරිපාලනමය කටයුතු සිදු කරගැනීමේදී දෙමළ කතා කරන ජනතාව මුහුණදෙන භාෂාමය ගැටළු කඩිනමින් විසඳීමට පියවර ගනිමි.

ඕනෑම පුද්ගලයෙකුට කිසිදු බාධාවකින් හෝ මදි පුංචිකමකින් තොරව තම ආගම ඇදහීමට හා වන්දනාමාන කිරීමට තිබිය යුතු නිදහස සහතික කරමි.





# විශ්වාසනීය වෙනසක්

## 6.මම සෞඛ්‍ය සේවය හා අධ්‍යාපනය ක්‍රමවත්ව නගා සිටුවමි.





පළමු මාසය ඇතුලත සෞඛ්‍ය සේවයේ හදිසි තත්ත්වයක් ප්‍රකාශයට පත්කොට බාල ඖෂධ ආනයනය නැවැත්විමට පියවර ගන්නා අතර උසස් තත්ත්වයේ ඖෂධ රජයේ රෝහල්වලින් ලබා ගැනීමට අවකාශ සලසමි. දැනට ඉවක් බවක් නැතිව පැතිර යන වසංගත රෝග මර්දනය කිරීම සඳහා පියවර ගනිමි. ඖෂධ ගෙන්වීම පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට පියවර ගනිමි.

මම පළමු මාසය ඇතුළත අපගේ අධ්‍යාපන ක්‍රමය පිළිබද විශ්වාසය යළි තහවුරු කරමි. විශ්වාසනීය විභාග පටිපාටියක් ඇති කිරීමටත්, 2011 පළමු ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා සාධාරණ ක්‍රමවේදයක් සකස් කිරීමටත් විශේෂ කාර්ය සාධක බලකායන් පත්කරමි. අපගේ ගමේ සහ නගරයේ පාසැල්වල පවතින "නගරෙට කිරි ගමට කැකිරි" ප්‍රතිපත්තිය මුලිනුපුටා දමමි. සියලුම සරසවි සිසුන්ට නේවාසික පහසුකම් ලබාදීම ඇතුලු සරසවි සිසුන්ගේ අවශ්‍යතා ඉටුකිරීමට පියවර ගනිමි.





# විශ්වාසනීය වෙනසක්

## 7. මම කාන්තා අයිතීන් සුරකින ගෞරවනීය තත්වයක් ඇතිකරමි.



මම මාස 2 ක් ඇතුළත කාන්තා අයිතිවාසිකම් පණත ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියා කරන අතර කාන්තාවගේ ආරක්ෂාව සහ රැකවරණය සඳහා ගත යුතු සෑම පියවරක්ම ගන්නා බවට සහතික වෙමි.

කාන්තාවන් මුලිකත්වය දරන ගෘහ ඒකකවලට උපකාර කිරීම සඳහා සැලසුම් සකස් කිරීමට විශේෂ කාර්ය සාධක බලකායක් පත් කරමි. ණය සැපයීම සඳහා කාන්තා බැංකුවක් ආරම්භ කිරීමට කටයුතු කරමි.

විදෙස් ගත ශ්‍රී ලාංකික කාන්තාවන්ගේ ආදායම් ප්‍රවර්ධනය හා ආරක්ෂාව සහතික කරන නව වැඩපිලිවෙළක් ක්‍රියාවට නගන අතරම ඔවුන්ගේ පවුල් මුහුණදී තිබෙන සමාජ ආර්ථික ගැටලු විසඳීම සඳහා සෘජුව මැදිහත්වන කාර්යාංශයක් පිහිටුවමි.



## 8.මම තරුණ පරපුරට රැකියා ලබාදෙමි.



මාස 3 ක් ඇතුළත 'යොවුන් අභියෝගය' වැඩසටහන ආරම්භ කිරීමට පියවර ගනිමි. වයස අවු 17-25 ත් අතර තරුණ තරුණියන්ට ජාතිය වෙනුවෙන් සේවය කිරීමටත්, තම ජීවිතය හැඩ ගස්වා ගැනීමටත් මෙමගින් අවකාශ ලැබේ.

පරිඝණක මෘදුකාංග, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, මත පදනම් වූ සේවා සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළු වෘත්තීය පුහුණුව ලබා ගන්නා අතරතුර රු. 2000 ක මාසික දීමනාවක්ද ඔවුන්ට ගෙවනු ලැබේ. මෙම යෝජනා ක්‍රමයට දහම් පාසල් ගුරුවරුන්ද ඇතුළත්වේ.

මේ සඳහා ඇතුළත්වීමට කැමති උපාධිධාරීන් වෙතොත් ඔවුන්ට අමතර රු. 3000 ක දීමනාවක් ගෙවනු ලැබේ. 'යොවුන් අභියෝගය' වැඩසටහන සම්පූර්ණ කළ තරුණ තරුණියන් සඳහා රැකියා ලබාදීම පිණිස රජය හා පුද්ගලික අංශය යටතේ 'වැඩ කරන යොවුන් පරපුර' වැඩසටහන ආරම්භ කරමි.





# විශ්වාසනීය වෙනසක්

## ෟ.මම යුක්තිගරුක සහ විනය ගරුක සමාජයකට අඩිතාලම දමමි.



සාර ධර්ම සුරකින සමාජයක් බිහිකිරීම සඳහා මම පෙරමුණ ගනිමි. අධිකරණයේ ස්වාධීනත්වයට එල්ලවී ඇති සියලු බාධක වහාම ඉවත් කිරීමට කටයුතු කරමි. අපක්ෂපාතී ගෞරවනීය පොලිස් සේවයක් මම ස්ථාපිත කරමි. ඔවුන්ගේ සේවයට ඇති කැපවීම අගයන අතර වසර 22 ක සේවා කාලයෙන් පසු විශ්‍රාම යාමට කැමති අයට සම්පූර්ණ විශ්‍රාම වැටුප් සහිතව විශ්‍රාම යාමට අවසර දෙමි.

ඉහත කරුණු සියල්ල කඩිනමින් ඉටුකරමින් මම විනය ගරුක පුරවැසියන්ගෙන් සමන්විත රටක් තුළ ශිෂ්ට සම්පන්න සමාජයක් ගොඩනැගීමේ මූලික පදනම ඇති කරමි.

පතාල ලෝකයේ මැර කණ්ඩායම් හා අවිගත් කණ්ඩායම් මුලිනුපුටා දැමීමට මම වහාම පියවර ගනිමි. සියලු පැහැර ගෙනයාම් සහ ඝාතන පිළිබඳව පරීක්ෂණ පවත්වා නීතියේ ආධිපත්‍ය යළි ස්ථාපිත කරමි.





# විශ්වාසනීය වෙනසක්

## 10.මම ජාතික ආරක්ෂාව සුරකිමි.



අසල්වැසි රටවල ආරක්ෂක තත්ත්වය සැළකිල්ලට ගනිමින් 21 වෙනි සියවසේ අභියෝගවලට මුහුණ දිය හැකි වන පරිදි අපගේ ආරක්ෂක හමුදා නවීකරණය කරමි.

ආරක්ෂක හමුදාවල සහ සිවිල් ආරක්ෂක බලකායේ සාමාජිකයින් සදහා ඉහළ මට්ටමේ සුබසාධන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සහතික කිරීමට අවශ්‍ය පියවර ගනිමි. අවාසනා-වන්ත ලෙස ආබාධිතවූ ආරක්ෂක හමුදා සාමාජිකයින්ගේ සුබසාධනය මම සහතික කරමි. රණවිරු සුභසාධනය සඳහා ජනතා ආධාර මත ඇති කළ 'අපි වෙනුවෙන් අපි' අරමුදලේ අක්‍රමවත්, දූෂිත, පරිපාලනය ඉවත් කොට කාර්යක්ෂමව මුළුමනින්ම රණවිරු සුභස-ාධනය සඳහා යොදවමි.

රටවෙනුවෙන් තම ජීවිත පරිත්‍යාග කළ සියලු දෙනා මම නිරන්තරයෙන් සිහිපත් කරන අතර ඔවුන්ගේ පවුල්වල සුබසාධනය සහතික කරමි.

අප රටේ අවශ්‍යතා සඳහා ලෝකයේ සියලුම රටවල් සමග මිත්‍ර සබදතා පවත්වාගෙන යන බවට මම සහතික වෙමි.





# විශ්වාසනීය වෙනසක්

## විශ්වාසනීය වෙනසක්

එය ජනවාරි 26 වෙනිදා ඔබේ තේරීම මත තීරණය වේ.

ඔබ මහින්ද රාජපක්ෂ තෝරා ගතහොත් අල්ලස, දූෂණය, පවුල්වාදය හා තම ප්‍රතිරූපය පුම්බාගැනීම සඳහා කරන නාස්තිකාර වියදම්වල බර තව තවත් ඔබේ පවුල මත පැටවෙනු ඇත.

මෙය තීරණාත්මක මොහොතක්.

ප්‍රජාතන්ත්‍රවාදය තහවුරු කර, දූෂණය තුරන් කර, රැකියා නිර්මාණය කර, ආදායම් වැඩිකර, ජීවන බර සැහැල්ලු කර ඔබේ පවුලට උපකාර කිරීමට ඔබේ වටිනා ඡන්දය නිර්භීතව සරත් ෆොන්සේකා වන මට ලබාදී විශ්වාසනීය වෙනසකට මුල පුරන්න.

සරත් ෆොන්සේකා